# ශ්‍රී ලාංකීය ජන සමාජයේ දේව සංකල්පය තහවුරු වීමෙහි ලා කණ්ඩායම් සන්නිවේදනයේ භූමිකාව

## අලුත්නුවර දැඩිමුණ්ඩ දේව සංකල්පය ඇසුරෙනි

**නයනා සුරවීර**


## Abstract

මිනිසාගේ ජීවිතය හසුරුවා පාලනය කළ හැකි අදෘශ්‍යමාන බලවේගයක් ඇතැයි යන විශ්වාසය එදා මෙදා තුර සෑම ජන සමාජයකම දක්නට ලැබෙන්නා වූ අපූර්ව පිළිගැනීමයි. මානවයාගේ ඇදහීම් හා විශ්වාස තුළට දෙවියන් පිළිබඳ සංකල්පය ඇතුල් වූයේ කෙසේ ද යන්න විමසීමේ දී එය ඔහුගේ ආරම්භක කාල වකවානුව දක්වාම දිව යන බව පැහැදිලි විය. එකල පැවති පුද පූජා ක්‍රම පිළිබඳ තිර නිගමනයකට බැසිය නොහැකි වුවත් තමන්ට හසුරුවාලිය හැකි ආකාරයේ අදෘශ්‍යමාන බලවේගයක් ඇතැයි යන විශ්වාසය ඇති වූ දිනයේ පටන් දෙවියන් පිළිබඳ හැඟීම ද තහවුරු වන්නට ඇත. වැඩි අස්වැන්න මිනිසුන්ගේ ප්‍රීතිමත් ජීවිත දෙවියන් විසින් ලබාදුන් ත්‍යාග ලෙසත්, ස්වභාවික උපද්‍රව, ලෙඩරෝග දෙවියන් කෝපවීම හේතු කොටගෙන සිදුවන දුෂ්කරතා ලෙසත් ආදී කල්පිකයා විශ්වාස කළහ. වසර මිලියන ගණනක් ගත වුව ද අන්තර්වර්තීව තහවුරු වූ මෙම ශක්තිමත් හැඟීම පරම්පරාවෙන් පරම්පරාවට යම් යම් සන්නිවේදන ක්‍රමෝපායන් ඔස්සේ නොවෙනස්ව එපරිදිම ශක්තිමත්ව වර්තමානයේ වඩාත් තහවුරු වී ඇති අයුරු අධ්‍යයනය කළ හැකි විය. මෙවන් ප්‍රබල බලපෑමක් මිනිස් සිතුවිලි වලට එල්ල කිරීමට අදෘශ්‍යමාන බලවේගයකට හැකි වන්නේ කුමන කරුණු හේතු කොට ගෙන ද යන්න මෙන්ම සන්නිවේදනය ඊට කුමන

බලපෑමක් එල්ල කර ඇද් ද යන්න අධ්‍යයනය කළ යුතු වූවකි. එබැවින් මෙම අධ්‍යනය මගින් විමසා බැලෙනුයේ දේව සංකල්පය ලාංකේය ජන සමාජයේ තහවුරු වීම කෙරෙහි කණ්ඩායම් සන්නිවේදනයේ බලපෑම සිදු වූ ආකාරයයි. එහිදී අධ්‍යයනය සඳහා විශේෂිත වන්නේ සතර කෝරළයේ අලුත්නුවර කේන්ද්‍ර කොට ගනිමින් සම්මතව පවතින දැඩිමුණ්ඩ දේව ඇදහිල්ලයි. අධ්‍යයනය සඳහා අදාළ දත්ත සපයා ගනු ලැබූයේ සමීක්ෂණ ක්‍රමය මගිනි. එහිදී දේවාලයට පැමිණෙන බැතිමතුන්ගෙන් අහඹු ලෙස තෝරා ගනු ලැබූ 200 කුගෙන් ප්‍රශ්නාවලි ක්‍රමය ඔස්සේ සහ දේවාලයේ තේවාව බාර කපු මහතුන්ගේ සම්මුඛ සාකච්ඡා ක්‍රමයට අනුව වැඩිදුර දත්ත රැස් කර ගන්නා ලදී. එමෙන්ම ස්වයං නිරීක්ෂණ ක්‍රමය යොදා ගනිමින් අවශ්‍ය දත්ත රැස් කොට ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන ක්‍රම ද්විත්වය ඔස්සේම දත්ත විග්‍රහයට ලක් කරන ලදී. සන්නිවේදනය තුළ දැඩිමුණ්ඩ දේව සංකල්පයේ ක්‍රියාකාරිත්වය සමාජයේ තහවුරු වීම උදෙසා කණ්ඩායම් සන්නිවේදනය ප්‍රබල භූමිකාවක් පාරම්පරිකව අතීතයේ සිට අද දක්වා පමණක් නොව අනාගතයේත් ඉටු කරන ආකාරයක් හඳුනාගත හැකි විය.



### ප්‍රමුඛ පද

ඇදහීම් හා විශ්වාස, අදෘශ්‍යමාන බලවේග, දේව ඇදහිල්ල, දැඩිමුණ්ඩ දේව සංකල්පය


### හැඳින්වීම

එක් අයෙක් , කීප දෙනෙක් කණ්ඩායමක් අමතා කෙරෙන කථාවක් සාකච්ඡාවක්, දේශනයක් ආදිය සමූහ සන්නිවේදය නොහොත් කණ්ඩායම් සන්නිවේදනය නම් වේ[1]. පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා වැඩි පිරිසක් සහභාගි වෙන සන්නිවේදනය එහි සහභාගිත්වය අනුව සමූහ සන්නිවේදනය යැයි හැඳින්වෙන අතර, උදාහරණ වශයෙන් සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය සමූහ සන්නිවේදන අංග ලෙස දැක්විය හැක[2]. සමූහ සන්නිවේදනයේ දී ශබ්ද විකාශන යන්ත්‍ර, පත්‍රිකා ආදිය උපයෝගි කර ගත්ත ද එය ද ඒ වෙලාවේ රැස්ව සිටි පිරිසට පමණක් සීමා වේ. සමූහ සන්නිවේදනයේ දී ද ප්‍රතිපෝෂණය ඇති නමුත් එය ද එක්තරා දුරකට සීමිත සන්නිවේදන ක්ෂේත්‍රයකි. සමූහ සන්නිවේදනයේ දී පුද්ගලාන්තර සන්නිවේදනයේ දී මෙන් පෞද්ගලික බව වෙනුවට පොදු බව දැක්විය හැකිය. කුඩා ජන කණ්ඩායම් ග්‍රාමීය අදහස් උදහස් සාකච්ජා කිරීමට ආදිය මෙම සමූහ සන්නිවේදන කාර්යය උපයෝගි කරගනී

[1] Retrieved from: https://2012books.lardbucket.org/pdfs/an-introduction-to-group-communication.pdf
[2] Retrieved from: https://www.reference.com/world-view/meaning-group-communication-311ad529707e9fd5

(පෙරේරා; 258). කණ්ඩායම් සන්නිවේදනය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති නිර්වචන සැලකිල්ලට ලක් කරන විට එහි පොදු අදහසක් පහත පරිදි ගොඩ නැංවිය හැක.

- ශාරීරික වශයෙන් මිනිසුන්ගේ සම්බන්ධතාව ඇති කිසියම් එකතුවක්
- සමාන චරිතාංගවලින් යුක්ත මිනිසුන් සමූහයක්
- නැවත නැවත සිදුවන අන්තර් ක්‍රියා රටාවන්ගෙන් යුක්ත සංවිධානාත්මක මිනිස් එකතුවක්
- සාමාජිකත්වයෙන් හා අන්තර් ක්‍රියාවන්හිදී සමාන විඥාන මට්ටමකින් යුක්ත පිරිසකි (රාජපක්ෂ; 25).

මානවයාට තනිවම සිය මූලික අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට නොහැකි වීම මත ඔහු අතීතයේ සිටම කණ්ඩායමක් වශයෙන් එකට එකතු වී කටයුතු කර ඇත. මෙම ප්‍රාථමික අවධියේ දී මානවයාගේ අවශ්‍යතා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට අවශ්‍ය නොවූයේත් එහි විවිධතා දක්නට නොලැබුණේත් මිනිසුන් රාශියකගේ අවශ්‍යතාවන්ගේ කිසිදු වෙනස්කමක් දක්නට නොලැබුණු හෙයිනි. නමුත් ක්‍රමයෙන් මෙම වානර මානවයා ක්‍රමයෙන් ශිෂ්ඨාචාරගත වීම හා සමගාමීව ඔවුන්ගේ ජීවිත විශාල පරිවර්තනයකට ලක් කරන ලදී එවිට ඇති වූ විවිධ පවුල් අතරේ ඥාති සම්බන්ධතා මෙන්ම සෙසු කටයුතු පසු කාලීනව විවිධ සමාජ සිරිත් විරිත් වලට මගපෑදුවා වන්නට ඇත (විජේසේකර; 225).

එබැවින් මානවයාගේ ඇදහීම හා විශ්වාස තුළට දෙවියන් පිළිබඳ සංකල්පය ඇතුල් වූයේ කෙසේ ද යන්න විමසීමේ දී එය ඔහුගේ ආරම්භක කාල වකවානුව දක්වාම දිව යන බව පැහැදිලිය. එකල පැවති පුද පූජා ක්‍රම පිළිබඳ තිර නිගමනයකට බැසිය නොහැකි වුවත් තමන්ට හසුරුවාලිය හැකි ආකාරයේ අදෘශ්‍යමාන බලවේගයක් ඇතැයි යන විශ්වාසය ඇති වූ දිනයේ පටන් දෙවියන් පිළිබඳ හැඟීම ද තහවුරු වන්නට ඇත. වැඩි අස්වැන්න මිනිසුන්ගේ ප්‍රීතිමත් ජීවිත දෙවියන් විසින් ලබාදුන් ත්‍යාග ලෙසත්, ස්වභාවික උපද්‍රව, ලෙඩරෝග දෙවියන් කෝපවීම හේතු කොටගෙන සිදුවන දුෂ්කරතා ලෙසත් ආදී කල්පිකයා විශ්වාස කළහ. අන්තර්වර්තීව තහවුරු වූ මෙම ශක්තිමත් හැඟීම වසර මිලියන ගණනක් ගත වුව ද නොවෙනස්ව එපරිදිම ශක්තිමත්ව වර්තමානයේ තහවුරු වී ඇති අයුරු අධ්‍යයනය කළ හැකි විය. මිනිසා තුළ සිදුවන ස්වයං සන්නිවේදනයේ ප්‍රබල බව නොවන්නට ඔහු මෙවැනි අද්භූත, අදෘශ්‍යමාන බලවේගයන් කෙරෙහි මෙතරම් විශ්වාසයකින් කටයුතු නොකරනු ඇත.

මෙවැනි සිරිත් විරිත් හෝ ඇදහිලි හෝ විශ්වාස කඩ කරන්නට පවුලේ හෝ සමාජයේ කිසිවෙකු ඉදිරිපත් නොවන්නේ එසේ වුවහොත් එහි අනර්ථකාරී ප්‍රතිඵල තමාටම අත්විඳින්නට සිදුවන බව අත්දැකීමෙන්ම පසක් කොට ගෙන ඇති බැවිනි.

මෙය ඔවුන්ගේ ආගම හා සම්බන්ධ කළහොත් පෙරටත් වඩා රළු ආකාරයට පුද්ගලයන් හික්මවන ආකාරය හඳුනා ගත හැක. සංස්කෘතියේ ආරම්භයේ සිටම මානව ක්‍රියාකාරකම් සමග බැඳී පැවති මූලිකාංගයක් ලෙස ආගම (Religion) හඳුනාගත හැකි බව දයා අමරසේකරයන්ගේ මතය වී තිබේ. ආගම "රිලිජන්" හෙවත් ආගම යන පදය ලතින් භාෂාවේ Relegere රිලිජරි හෙවත් (To Observe) සමාදන්වීම, සැලකිලිමත් වීම, රැකීම යන අර්ථයෙන් ඉදිරිපත් වී ඇති බව මානව විද්‍යාඥයන්ගේ පිළිගැනීමයි. ආගම පිළිබඳ හැඟීම පාදක කොටගෙන සෑම සංස්කෘතියකටම අයත් ජනතාව විසින්ම යම් යම් විශ්වාස ගොඩනගා සිටිනවාක් මෙන්ම ඒ ඔස්සේ විවිධාකාර ක්‍රියාවන් වල ද නියැලී සිටිති. මෙම විශ්වාස ඇදහිලි ආදී සියල්ලම පොදුවේ විභාග කරන විට ආගම පුළුල් සමාජ සම්මුතියක් ලෙස සැලකීමට සිදුවේ. සමාජයක් ගොඩ නැඟී පවතින්නා වූ සාරධර්ම ඇගයුම් හා ආකල්පය ප්‍රකට කරන මාධ්‍යයක් හැටියට ආගම සමාජය සමග පවත්වාගෙන යන මෙම ගෞරවාන්විත වූ සම්මුතිය සෑම සමාජයකටම පොදු වූවකි. අනෙක් අතට ආගමික මතවාද හා අරමුණු එකිනෙකින් විවිධ වුවත්, ඒ හැම එකකම අවසාන ඵලය සමාජයට හිතකර සමාජානුයෝගී පුද්ගලයෙකු නිර්මාණය කිරීම බව ද පෙනේ. එපමණකුත් නොව ආගම සමාජය තුළ පවතින ප්‍රධානතම සමාජීය සංස්ථාවක් ද වෙයි. එය සමාජය තුලින්ම උපත ලබා එයම පෝෂණය කරන කෘත්‍යමය තර්කයන්ය යන අදහස් ද කෘත්‍යවාදී සමාජ මානව විද්‍යාඥයන්ගේ පිළිගැනීමකි (අමරසේකර, 1988).

දෛනිකව පුද්ගලයාට මුහුණ දීමට සිදුවූ අනේක විධ ලෙඩදුක්, කරදර, අතුරු ආන්තරාවන්ට විද්‍යාත්මක පිළිතුරු සෙවීම පසෙක ලා එම ආන්තරාවලට වින කරන යම් බලවේගයක් ඇතැයි විශ්වාස කළහ. ඒ අනුව දේව, භූත, යක්ෂ, ප්‍රේත ආදීන්ගේ පිහිට පැතීමට ඔවුන් සතුටු කරනු පිණිස ගොඩ නගාගත් පිළිවෙත් ලෙස බිලි පූජා පිදේනි, යන්ත්‍ර, මන්ත්‍ර, තොවිල් හඳි හූනියම් ආදී අභිචාරාත්මක අංග ලක්ෂණයන් ඔවුන්ගේ ජීවිතයේ අංගයක් විය.

එහිදී ඒ ඒ ප්‍රදේශයට අධිපති දෙවියා ඇදහීමට හෝ ඔවුන්ට ආවේණික දෙවි කෙනෙකු පරම්පරාගතව ඇදහීමට මෙකී කණ්ඩායම හුරුවී සිටින ආකාරයක් හඳුනාගත හැක. ඔවුන්ට ආවේණික වූ දෙවියෝ කවුරුන් හෝ වේවා ඔවුන්ගේ ජීවිතයේ සියලු භෞතික හා අධ්‍යාත්මික කරුණු සම්බන්ධව ඔහු සර්ව බලධාරියා වී ඇත්තාහ. එහිදී ඔවුන් ගොඩනගා තිබෙන ඥාතීත්වය යන සාධකය ප්‍රබල බලපෑමක් එල්ල කරනු ලබන බව ඥාතීත්වය මත ගොඩනැගුණු සම්බන්ධතා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි කරගත

හැක. එසේ නම් පරම්පරාවෙන් පරම්පරාවට ගලා එන ඇදහීම් හා විශ්වාසයන්ගේ ප්‍රබල වෙනස්කම් තිබිය නොහැක. මෙය උපකල්පයනක් කොට ගනිමින් දැඩිමුණ්ඩ දේව සංකල්පය තහවුරු වීමෙහි ලා කණ්ඩායම් සන්නිවේදනය කෙසේ ක්‍රියාත්මක වේද යන්න සොයා බැලීම උදෙසා සමීක්ෂණයක් සිදු කරනු ලැබිණ.

**පර්යේෂණ ගැටලුව**

ලාංකේය ජන සමාජය තුළ දේව සංකල්පය තහවුරු වීමෙහි ලා කණ්ඩායම් සන්නිවේදනයේ භූමිකාව කෙසේ වීද යන්න අධ්‍යයනය කිරීම මූලික විය.

**පර්යේෂණ අරමුණ**

ලාංකේය ජන සමාජය තුළ දේව සංකල්පය තහවුරු වීමෙහි ලා කණ්ඩායම් සන්නිවේදනයේ භූමිකාව පිළිබඳව අධ්‍යයනය කිරීම මූලික අරමුණ වූ අතර පර්යේෂණ අභිමථාර්ථ පහත පරිදි විය.

**පර්යේෂණ අභිමථාර්ථ**

කණ්ඩායම් සන්නිවේදනයේ සැකැස්ම සහ එහි මූලික කාර්යභාරය අධ්‍යයනය කිරීම ලිඛිත සහ අලිඛිත මූලාශ්‍ර තුළ දැඩිමුණ්ඩ දේව සංකල්පය සමාජගත වී ඇති ආකාරය විමර්ශනය කිරීම

**දත්ත විශ්ලේෂණය**

අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලයට පැමිණෙන පුද්ගලයන් 200 දෙනෙකු අහඹු ලෙස යොදා ගනිමින් අදාළ සමීක්ෂණය සිදු කරනු ලැබිණ.

එහිදී දත්ත දායකයන් දෙසීය දෙනෙකුට (200) අදාළ පර්යේෂණ පත්‍රිකා ලබා දුන්හ. එහිදී ඇතැම් ප්‍රශ්ණ සඳහා පිළිතුරු නොසපයා සිටිය ද අදාළ මුළු පිරිසම පර්යේෂණ පත්‍රිකාවන්ට පිළිතුරු දීමට ඉදිරිපත් විය. එසේ වන්නට ඇත්තේ එය ද දෙවියන්ගේ කාර්යයකට හවුල් වීමකැයි සලකා ගෙන බව අනාවරණය විය. පර්යේෂණයෙන් තෝරාගත් අහඹු නියැදියේ දක්නට ලැබුණු විශේෂත්වයක් වූයේ ස්ත්‍රී සහභාගිත්වයේ වැඩි ප්‍රතිශතයයි. ඇතැම් විට පිරිසෙන් ස්ත්‍රීන් පිළිතුරු දෙන්නට ඉදිරිපත් වූවා විය හැක. කෙසේ වුවත් ස්වයං නිරීක්ෂණ තුළින් ද මෙම කරුණු සනාථ කර ගැනීමට හැකි විය.

සමීක්ෂණයට සහභාගි වූ පිරිසෙන් 128 ක් ස්ත්‍රීන් ද 72 ක් පුරුෂයින් ද විය. එක හා සමාන මට්ටමකින් ස්ත්‍රී පුරුෂ සහභාගිත්වයක් දේවාල භූමියේදී දැකගත හැකි වුවත්, පවුලක කාන්තාවට එහිදී මුල්තැන ලැබී ඇති බව පැහැදිලි විය.

*වයස් පරතරය*

| | |
|---|---|
| අවුරුදුඃ 50 ට වැඩි | - 86 |
| අවුරුදුඃ 20-50 අතර | - 80 |
| අවුරුදුඃ 20 ට අඩු | - 34 |

වශයෙන් වර්ග කළ විට වැඩි ප්‍රතිශතයක් අවුරුදු 50 ට වැඩි කොටස නියෝජනය කරනු ලැබීය. එහිදී 86 % ක් වැඩිහිටි පිරිස ද 20-50 අතරේදී නව යොවුන් මෙන්ම මැදිවියේ පසුවන පිරිස්ද 80% ක ප්‍රතිශතයක් විය. අවුරුදු 20 ට අඩු පිරිස 34% ක් වූ අතර ඔවුන් තමන්ගේ වැඩිහිටියන්ගේ මෙහෙයවීම යටතේ ඔවුන් හා එක්ව දේවාලයට පැමිණ ඇති බව අධ්‍යයනය කළ හැකි විය.

සපයා දුන් දත්ත අනුව ඉතා අඩු ප්‍රතිශතයක් හැරෙන්නට අන් පිරිස යම් මට්ටමකට හෝ අධ්‍යාපනය ලද පුද්ගලයන් වීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. 10 ශ්‍රේණිය දක්වා ඉගෙන ගත් පිරිසේ ප්‍රතිශතය ඉහළ අගයක් ගනු ලැබුවේ වැඩිහිටි පිරිස් නිසා වන්නට ඇත. අතීතයේ සිට වර්තමානයට පැමිණෙන විට අධ්‍යාපනය නොලැබූ සංඛ්‍යාව ඉතා පහළ අගයක් ගැනීම ස්වභාවික සිදුවීමක් වන්නා සේම තරගකාරී සමාජ රටාවක් සමග කියවීමට හා ලිවීමට නොදත් පිරිස ඉතාම අඩු අගයක් ගෙන ඇත. එය 08% ක තරම් ප්‍රතිශතයකි.

සපයන ලද දත්ත අනුව තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ රාජ්‍ය රැකියාවන්හි නියුතු පිරිසේ ඉහළ ප්‍රතිශතයයි. එය 58 % ක ප්‍රතිශතයකි. විශ්‍රාමික පිරිස ද පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරත පිරිස් ද 24 % ක ප්‍රතිශතයකි. රියදුරු රැකියාව කරන පිරිස මෙහිදී වෙනම ම හදුනාගෙන ඇත්තේ 20% ක ප්‍රතිශතයක් සේයි. එය වෙනමම ප්‍රතිශතයක් දැඩිමුණ්ඩ දෙවියන් බැහැ දැකීමට පැමිණෙන පිරිස් අතරේ සිටින ප්‍රධාන කොටසක් රියදුරන් වන බැවිනි. අලුතින් වාහනයක් මිළ දී ගත් විට, වාහනයට යම් අසුභ යමක් වූ විට, (බළලෙක් අසු වූ විට ....... වැනි දෑ) ඇස්වහ කටවහ දුරුවන්නැයි ඉල්ලා ඔවුන් පැමිණෙන්නේ දෙවියන් වෙතය. එහිදී පූජා වට්ටිය හා ඒ සමග වාහනයේ යතුර ද දේවාලය තුළට ලබා දී ආශිර්වාදය ලබා ගනී. පසුව පඬුර වාහනයේ ගැට ගසා මල් මාලය ද වාහනයේ තැබීම පුරුද්දක් වේ. ඇස්වහ කටවහ දුරුවන්නට දෙහි ගෙඩි තුනක් මැදට මිරිස් කරල් දමා වාහනයේ ඉදිරිපස එල්ලයි. ශිෂ්‍යයන් දේවාලයට පැමිණෙන්නේ ඔවුන්ගේ වැඩිමහල් පරම්පරාවේ අනුදැනුම මතය. ඇතැම් විට අදාළ දරුවාගේ යම් කටයුත්තකටය (විභාගයක්, සම්මුඛ පරීක්ෂණයක් වැනි කටයුත්තක් උදෙසා දෙවියන් දැකීමට පැමිණ ඇත).

දේවාලයට පැමිණෙන බැතිමතුන්ගෙන් වැඩි පිරිසක් දැඩිමුණ්ඩ දෙවියන් කෙරෙහි වූ අචල භක්තියක් ඇත්තෝ වූහ. තමන්ට කරදරයක් වූ සෑම අවස්ථාවකදීම සෑම අතින්ම දැඩිමුණ්ඩ දෙවියෝ පිහිට වූ බව ඔවුන්ගේ විශ්වාසය වෙති. එය 187% ක ප්‍රතිශතයක් විය. 03% ක අඩු ප්‍රතිශතයක් දෙවියන් කෙරෙහි විශ්වාසයක් නැති බව පැවසුව ද එය දැඩිමුණ්ඩ දෙවියන්ට පමණක් විශේෂිත වූවක් නොව සමස්ත දේව කොට්ඨාශය පිළිබඳවම පවතින්නා වූ අවිශ්වාසයකි. මේ කොටස් දෙකටම 10% ක ප්‍රතිශතයක් අයත් නොවූහ.

දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීමට යොමුවූයේ කවර හේතුවක් නිසා ද යන කරුණ අදාළ මාතෘකාව හා සම්බන්ධයෙන් වැදගත් වූ ප්‍රශ්නයකි. මෙහිදී අධ්‍යයනය කළ හැකි විශේෂිත කරුණක් වූයේ, තමාට වඩා වයසින් වැඩි අයෙකුගේ පෙළඹවීම මත මෙන්ම ඔවුන් විසින් දැඩිමුණ්ඩ දෙවියන් කෙරෙහි ඇතිකරවන ලද විශ්වාසයන් හේතුකොටගෙන පරම්පරාවෙන් පරම්පරාවට පවුලේ ඥාති සමූහයම විසින් කණ්ඩායමක් ලෙස දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීමට පෙළඹ වී ඇති බවයි.

තමන්ගේ පෞද්ගලික කටයුතු වලදී පිහිට වේ යැයි සිතා දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීමට පෙළඹ වී ඇති බව පැහැදිලි විය. නමුත් මෙකී කරුණු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරනවිට පැහැදිලි වූයේ වෙනත් කෙනෙකු විසින් දෙවියන් කෙරෙහි තමා තුළ කරනු ලබන විශ්වාසය ඊට හේතු වී ඇති බවයි. දේවාලයට පැමිණෙන පුද්ගලයන් 18% ක ප්‍රතිශතයක් එසේ වෙනත් කෙනෙකු නිසා විශ්වාසය ඇති කරගත් පිරිසට අයත් වූහ.

එහිදී ගමේ පිරිසගේ මගපෙන්වීම මත දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීම සම්බන්ධයෙන් එතරම් බලපෑමක් කර නැති බව පෙනේ. එහිදී ද ගමේ පිරිස ලෙස අර්ථ ගැන්වූයේ තමාගේ පවුලට හිතවත් ඥාතීත්වයක් දක්වන පිරිසටයි. යහලුවන්ගේ මග පෙන්වීම මත දේවාලයට පැමිණි පිරිස 10% ක ප්‍රතිශතයකි. විශේෂයෙන් මෙහිදී දැකගත හැකි වූයේ දේවාලයට පැමිණි පිරිසගෙන් 158 % ක් ප්‍රතිශතයක් දෙවියන් ඇදහීමට පෙළඹී ඇත්තේ තම පවුලේ පොදු විශ්වාසය වූ බැවිනි. මුල් පරම්පරාවට යම් පෞද්ගලික හේතුවකට දෙවියෝ පිහිටවීමේ මූලික අඩිතාලම ලෙස සලකා එය පරම්පරාවෙන් පරම්පරාවට සංක්‍රමණය වූ අයුරු හඳුනා ගත හැක. සතර පෝයටම සිල්ගන්නා වැඩිහිටියෝත් සිටින පවුල් පවා තමන්ගේ දරුවන්ගේ දරුවන් පළමුවෙන්ම ගෙන යා යුතු බව පවසන්නේ දැඩිමුණ්ඩ දේවාලයටයි. ඉන්පසුව අන් ආගමික ස්ථානයන්ට කැඳවා ගෙන යයි.

ගමේ විවිධ පුද්ගලයන්ගේ අදහස් හා මතිමතාන්තර අනුව දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීමට 16% ක් පෙළඹී ඇති අතර යහලුවන් හේතු කොට ගෙන 10% ක ප්‍රතිශතයක් ඇදහීමට පෙළඹී හිදී. මෙය බොහෝවිට පුද්ගලාන්තර සන්නිවේදනය හේතු කොට ගෙන ඇතිවූවක් විය හැකි බවට අනුමාන කළ හැක. කෙසේ වුවත් මෙහිදී කැපී පෙනුනේ තම පවුලේ පිරිසගෙන් උරුම වූ ඇදහිල්ලක් බවට දැඩිමුණ්ඩ දේව ඇදහිල්ල පත්වී ඇති ආකාරයයි.

<u>දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීමට පෙළඹුනේ,</u>

| | |
|---|---|
| තමා විසින් ඇතිකරගත් විශ්වාසය මත | 18 |
| තම පවුලේ ප්‍රධාන විශ්වාසය දැඩිමුණ්ඩ දෙවියන් වන බැවින් | 158 |
| ගමේ විවිධ පුද්ගලයන්ගේ මග පෙන්වීම මත | 16 |
| යහලුවන්ගේ අදහස් මත | 08 |

කණ්ඩායම් සන්නිවේදනය තුල දැඩිමුණ්ඩ දේව සංකල්පය කෙසේ ක්‍රියාත්මක වන්නේ ද යන කරුණ සොයා බැලීමේ දී ඔවුන්ගෙන් අසනු ලැබූ පහත සඳහන් ප්‍රශ්ණය ද වැදගත් වූයෙකි.

බැතිමතුන් දේවාලයට පැමිණෙන්නේ,

| | |
|---|---|
| තනිවම | 06 |
| තවත් අයෙක් සමග | 44 |
| පවුලේ ඥාතීන් සහ හිතමිතුරන් සමග කණ්ඩායමක් ලෙස ( පිරිස තුන හෝ හතරට වැඩි) | 142 |
| යහලුවන් සමග | 08 |

ඉහත ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූයේ පොදුවේ කණ්ඩායමක් වශයෙන් දෙවියන් ඇදහීමට පෙළඹී ඇති ද යන කරුණ සොයා බැලීමයි. එහිදී තනිවම දේවාලයට පැමිණෙන පිරිස් 06% ක ප්‍රතිශතයක් ද, තව අයෙක් සමග 44% ක ප්‍රතිශතයක් ද විය. එහිදී ඉතා අඩු ප්‍රතිශතයක් තනිවම පැමිණෙන අයුරු නිරීක්ෂණය කරගත හැකි විය. බොහෝ විට පවුලක ස්වාමියා හා බිරිද එක්ව පැමිණෙන අයුරු ( එනම් දෙදෙනෙක් ) නිරීක්ෂණය කර ගත හැකි විය. අදාළ සමීක්ෂණය සිදු කරන්නට පෙරාතුව ගොඩ නගාගත් උපකල්පනයට සාර්ථක පිළිතුරක් ලබා දෙමින් දේවාලයට පැමිණෙන බැතිමතුන්ගෙන් 142 % ක ප්‍රතිශතයක් තමන්ගේ ඥාතීන් සමග පැමිණෙන බව අධ්‍යයනය කළ හැකි විය. එහිදී අධ්‍යයනයට ලක් කල පිරිසේ කණ්ඩායම අනිවාර්යෙන්ම පුද්ගලයන් හතර දෙනෙකු හෝ ඊට වැඩි විය. මෙහිදී කණ්ඩායම් සන්නිවේදනයේ එක් බෙදීමක් වන කුඩා කණ්ඩායම් සන්නිවේදනය පිළිබඳ දක්වා ඇති අර්ථ විවරණය මතක් කළ යුතුය. කුඩා ජන සමූහයන් සඳහා සන්නිවේදන යනු පුද්ගලයන් දෙතුන් දෙනෙකු සිට විසිපහක් පමණ වන ප්‍රමාණයක් දක්වා කෙරෙන සමූහ සන්නිවේදනයයි. (පියදාස; 53)

එසේ නම් මෙකී 142% ක ප්‍රතිශතය අයත් වන්නේ කණ්ඩායම් සන්නිවේදනයේ එක් අනු කොටසක් වන කුඩා කණ්ඩායම් සන්නිවේදනයට බව හඳුනාගත යුතුය. එහිදී හඳුනාගත හැකි තවත් විශේෂත්වයක් වූයේ මෙම කුඩා කණ්ඩායම එක් පවුලක සමීප ඥාතීත්වයක් ඇති පිරිසක් වන බවයි.

එලෙස පරම්පරාවන් එක්ව දැඩිමුණ්ඩ දේව වන්දනය සිදු කළ ආකාරයට නිදසුන් ලෙස රචිත විවිධ පද්‍ය කෘති පෙන්වා දිය හැක. අලුත්නුවර දේවාලයේ ප්‍රධාන කපු පරම්පරා දෙකෙන් එකක් වන කරුණාරත්න පරම්පරාව සතුව ඇති අත් පිටපතක් වන දැඩිමුණ්ඩ දිව්‍යරාජ වර්ණනාව , සිරි දැඩිමුණ්ඩ සිරිත නම් කෘතීන් පරම්පරාවක විශ්වාසය දැඩිමුණ්ඩ දෙවියන් වූ අයුරු ලිඛිතව සඳහන් කොට තිබේ. මෙම කෘතීන් දෙක විශේෂයෙන් හඳුනාගත හැකි වන්නේ එහි මුලින්ම පරම්පරාව සඳහන් කර තිබීමෙනි.

දැඩිමුණ්ඩ දිව්‍යරාජ වර්ණනාව කවි 41 කින් සමන්විතය. වේරගොඩ කුඩා බණ්ඩාර නම් තැනැත්තෙකු විසින් ලියා තිබේ.

වේරගොඩ පරපුර
පැවතෙන කුඩා බණ්ඩර
මැතිඳු කලි මනහර
මේ පොත පවති සදා ලකතුර

(දැඩිමුණ්ඩ දිව්‍යරාජ වර්ණනාව, කරුණාරත්න පරම්පරාව සතුව ඇත)

පරම්පරාවක විශ්වාස දෙවියන් වූ බව වේරගොඩ කවියා ප්‍රථමයෙන් පවසා සිටී.

අනෙක ප්‍රවෘත්ති කලාවේදියෙකු වන වෝල්ටර් සිරිමාන්න විසින් රචනා වූවකි. එහි විශේෂත්වය වන්නේ මෙරට ප්‍රසිද්ධම ප්‍රභූ පවුලක් වන විජේවර්ධන පරම්පරාව මුල් කොට ගෙන ලියවී තිබීමය. ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතනයක හිමිකරුවන් වන හෙයින් විජේවර්ධන මහතා ප්‍රමුඛ විජේවර්ධන පවුලට සෙත් ශාන්තිය ලබා දීම මුඛ්‍ය අරමුණ කොට ගෙන මෙය රචනා වී ඇති බව අවසානයට සඳහන් කරයි. මේ පිළිබඳ විමසූ විට වර්තමානයේ දේවාලයේ තේවාව බාර ප්‍රධාන කපු මහතා වන ධම්සිරි කරුණාරත්නයන් පැවසුයේ ඔවුන් තමන් ඉපදෙන්නටත් පෙර සිටම ඔවුන් අලුත්නුවර දේවාලයට පැමිණෙන බැතිමතුන් වන බවයි.

විජේවර්ධන පවුල මෙන්ම තවත් ප්‍රභූ පවුල් කීපයක්ම එකළ ඉතා වටිනා රථ වාහනවලින් අලුත්නුවර දේවාලයට පැමිණ ඇති බව රාජා කරුණාරත්න වන තම පියා තමන්ට පවසා ඇති බව ධම්සිරි

කරුණාරත්න මහතා පැවසීය. එසේ නම් එම කරුණු වලින් ද තහවුරු වන්නේ පරම්පරා ගණනාවක් තිස්සේ දැඩිමුණ්ඩ දේව විශ්වාසය ගමන් කර තිබූ අයුරුත් ප්‍රභූ පැලැන්තියක විශ්වාසය බවට දෙවියන් පත්ව තිබූ අන්දමත්ය.

සිරි දැඩිමුණ්ඩ සිරිත කෘතියේ අවසන් දස පද සැහැල්ල විජේවර්ධන පරම්පරාව පිළිබඳ විස්තර කොට ඇත.

> තෙරුවන වෙත සැදැ-බැති මල් පුදන දිවි හිමි
>
> විජයවඩවන පවුලට අයත් හැම දෙන
>
> විජය සිරිත යහතින් රැක බලා දෙන

ඉහත විස්තර සහ මෙම නිදසුන් මගින් ද ගම්‍ය වන්නේ පවුලක් ඥාතීත්වය යන සාධකය මූලික කර ගනිමින් කණ්ඩායමක් ලෙස එක්වී දැඩිමුණ්ඩ දෙවියන් අදහන ආකාරයයි. ඒ අනුව දැඩිමුණ්ඩ දේව ඇදහිල්ල සමාජගත වීම උදෙසා බලපෑ ප්‍රධාන කරුණු දෙකක් පහත පරිදි සාරාංශගත කළ හැක.

1- පාරම්පරික ඥාතීත්වය මත දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීම ව්‍යාප්ත වීම

2- විවාහය හේතුවෙන් ඇතිවන ඥාතීත්වය මත දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීම ව්‍යාප්ත වීම.

දේවාල භූමියේ සිට කරනු ලැබූ ප්‍රශ්නාවලියට අමතරව ස්වයං නිරීක්ෂණයෙන් සහ සම්මුඛ සාකච්ඡා මගින්ද පැහැදිලි වූයේ සෑම අවස්ථාවකම පාහේ පුද්ගලයන් සමූහයක් වශයෙන් දැඩිමුණ්ඩ දෙවියන් බැහැදැකීමට පැමිණෙන ආකාරයයි. එය දේවාලයේ තේවාව බාර ප්‍රධාන කපු මහතා වන ධම්සිරි කරුණානායක මහතා විසින් ද තහවුරු කරනු ලැබුවේ ඔහුගේ අත්දැකීම් සමගිනි. විශේෂයෙන්ම පෙරහැර සමයේ දී මෙම සාමූහික බව කැපී පෙනෙන ලක්ෂණයක් බව ඔහු ප්‍රකාශ කළේය. දෙවියන් බැහැ දැකීමට පැමිනෙන පිරිස් තවත් කිහිප දෙනෙකු සමග පැමිණ පොදු හෝ පුද්ගලික අභිමතාර්ථයක් උදෙසා දෙවියන් නමදී.

**නිගමනය**

සන්නිවේදනය තුළ දැඩිමුණ්ඩ දේව සංකල්පයේ ක්‍රියාකාරිත්වය විමසා බැලීමේ දී කණ්ඩායම් සන්නිවේදනය ප්‍රබල භූමිකාවක් ඉටු කරන ආකාරයක් හඳුනාගත හැකි විය. දෙදෙනෙකුට වැඩි පිරිසක් කණ්ඩායමක් ලෙස ඉතා සරළව හඳුනාගත හැක. පරම්පරාවෙන් පරම්පරාවට ගොඩනැගෙන ඥාතීත්වය නම් වූ පොදු ගුණාංගය මුල් කොටගෙන මුඛ පරම්පරාගතව එක් එක් පවුල් සමූහයා අතර පොදු වූ ඇදහීම් හා විශ්වාස ගොඩ නැගේ. පරම්පරා හතරක ක්‍රියාකාරිත්වය ඇදහීම දැඩිමුණ්ඩ දෙවියන් නම්, ඉන්පසු ඇති වී ඇති අන් පරම්පරා තුනටත් නිරායාසයෙන්ම එකී මුල් විශ්වාසය හෝ ඇදහීමේ ඇති වීම නොවැළැක්විය හැකි කරුණකි. මානවයා අද්භූත බලවේග කෙරෙහි තබා ඇති අනියත බිය හේතු කොටගෙන මෙසේ පාරම්පරිකව පැවත එන ඇදහීම් හා විශ්වාසයන්ට පිටු පෑමට හෝ අභියෝග කරන්නට ඉදිරිපත් වන්නේ නැත. ඒ අනුව පාරම්පරික ඥාතීත්වය හා විවාහය නම් වූ සාධකය මත ගොඩනැගෙන නව බන්ධුත්වය ද මෙම ඇදහීම් හා විශ්වාස පදනම් කොටගෙන කටයුතු කිරීම පැහැදිලි වූවකි. මෙසේ ගොඩනැගෙන කුඩා කණ්ඩායම් සාමූහික හැඟීමකින් යුතුව දේවාලය කරා පැමිණෙන ආකාරයක් නිරීක්ෂණය කරනු ලැබුවේ ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නාවලිය සහ නිරීක්ෂණ මගිනි.

**විමර්ශිත ග්‍රන්ථ**


An Introduction to Group Communication, retrieved on 15 Nov 2019 from https://2012books.lardbucket.org/pdfs/an-introduction-to-group-communication.pdf

What Is the Meaning of Group Communication?, retrieved on 15 Nov 2019 from https://www.reference.com/world-view/meaning-group-communication-311ad529707e9fd5

අමරසේකර, ඩී., ශ්‍රී ලංකා සමාජය- සමාජ විද්‍යාත්මක විමසුමක්, වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ.

ආර්. එල්., 1998. *සන්නිවේදන විමර්ශන*, මාධ්‍ය හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය

පෙරේරා, එච්. 1998. *වානර මිනිසා*, කතෘ ප්‍රකාශන

රාජපක්ෂ සී. 1998. *කුඩා කණ්ඩායම් සන්නිවේදනය*, කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ

විජේසේකර එන්. 1955. *ලංකා ජනතාව*, කොළඹ, එම්.ඩී ගුණසේන සහ සමාගම,